# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 1997 අංක 31 දරන වෛද්‍ය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1997 නොවැම්බර් මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 නොවැම්බර් මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 3.50 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

**1997 අංක 31 දරන වෛද්‍ය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1997 නොවැම්බර් මස 28 වන දින.]

එල්.ඩී.–ඕ. 22/96.

**වෛද්‍ය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1997 අංක 31 දරන වෛද්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (105 වන අධිකාරය වන) වෛද්‍ය ආඥාපනතේ 67අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 105 වන අධිකාරයේ 67අ වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (අ) ඡේදයේ "නිපුණත්වය සතුව තිබේ නම්" යන වචන වෙනුවට "නිපුණත්වය ඔහු සතුව තිබේ නම්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ වගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) ලියාපදිංචි කිරීම සඳහා වූ ඔහුගේ ඉල්ලුම් පත්‍රය අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද හෝ පිහිටුවන ලදැයි අදහස් කරනු ලබන වෛද්‍ය පීඨයක පීඨාධිපතිවරයකු විසින් නිර්දේශ කර ඇත්නම්";

(ඇ) "ඔහු ශ්‍රී ලංකාවේ තාවකාලිකව වාසය කරන කාලසීමාව තුළ වෛද්‍ය වෘත්තිකයකු" යන වචන වෙනුවට "ලියාපදිංචි කිරීමේ දිනයේ සිට මාස දොළහක් නොඉක්මවන කාලසීමාවක් තුළ වෛද්‍ය වෘත්තිකයකු" යන වචන ආදේශ කිරීමෙන්.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

2—D 045729–5,900 (97/09)

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.